

# ඒකාඅධිපති නාට්‍යය නරඹා ඇති වූ කම්පනය මා රංග ශිල්පියකු කළා

## ප්‍රවීණ රංග ශිල්පි ජනක කුඹුකගේ

### ජනක කුඹුකගේ

ජනක කුඹුකගේ අද දවසේ ශ්‍රීලාංකේය රංගන ක්ෂේත්‍රයේ සිටින සුවිශේෂී රංග පෞර්ෂයකට හිමිකම් කියන ප්‍රතිභාපූර්ණ සහ ප්‍රවීණ රංගන ශිල්පියෙකි. දශක කීපයකට පෙර වේදිකා නළුවෙකු ලෙස රංගනයට පිවිසි ජනක පසුකාලීනව වෘත්තීය රංගන ශිල්පියෙකු බවට පත්වීමෙන් පසු ටෙලි නාට්‍ය සහ සිනමාවටද සම්බන්ධ විය.

විජේපාල කුඹුකගේ සහ චන්ද්‍රා විජේපාල ගුරු යුවළගේ පළමු පිරිමි දරුවා ලෙස කොළඹදී උපත ලැබූ ජනක වාද්දූව බෞද්ධ කාන්තා විද්‍යාලයෙන් ආරම්භ කළ පාසල් අධ්‍යාපනය, වාද්දූව මධ්‍ය මහා විද්‍යාලයෙන් අවසන් කර ද්විතීයික අධ්‍යාපනය සඳහා තෝරාගත්තේ මරදාන කාර්මික විද්‍යාලය ය. එහිදී ව්‍යාපාර අධ්‍යනය පිළිබඳ ඩිප්ලෝමාවක් ලද ඔහු ජාතික කිරි මණ්ඩලයේ රැකියාවක් ලබාගත්තද රංගන ශිල්පියෙකු ලෙස කාර්ය බහුලවීමත් සමඟ රැකියාවට ආයුබෝවන් කියා සිය පූර්ණකාලීන වෘත්තීය ලෙස රංගනය තෝරාගත්තේය.

ජනක කුඹකගේ රංගනයට ආශක්ත වන්නේ උසස් පෙළ අධ්‍යාපනය ලබමින් සිටියදී කිසියම් දිනෙක පානදුරේදී වේදිකාගතකෙරුණු ධර්මසිරි බණ්ඩාරනායකගේ 'ඒකා අධිපති' ප්‍රේක්ෂකාගාරයේ අසුනක් මතදී ය. 'ඒකාඅධිපති' විසින් අවදිකළ සිය ආත්මගත රංගවේදියා සොයා යන ගමන ඔහු අරඹන්නේ ගාමිණී හත්තොටුවගේ නාට්‍ය පුහුණු පාඨමාලාවකට ඇතුළත්වීමෙනි. එය අවසන් කළ පසු ජර්මන් සංස්කෘතික කේන්ද්‍රයේ නාට්‍ය පුහුණු පාඨමාලාවකට ද. සෝමලතා සුබසිංහ මහත්මියගේ ළමා හා යොවුන් නාට්‍ය කේන්ද්‍රයේ නාට්‍ය වැඩමුළුවකටද සම්බන්ධවන ජනක ප්‍රසිද්ධ වේදිකාවට පා තබන්නේ නිහාල් සුරංජිත්ගේ 'සෙල්ටැඹ' වේදිකා නාට්‍යයෙනි.

එදා මෙදා තුර ජනක රංගන දායකත්වය ලබාදුන් වේදිකා නාට්‍ය සංඛ්‍යාවෙන් අඩු වුවද ඒවායේ ඔහු නිරූපනය කළ භූමිකාවන් කිසිදා ප්‍රේක්ෂක මතකයෙන් ඈත් නොවන තරම් ප්‍රභලය. ධර්මසිරි බණ්ඩාරනායකගේ 'ධවල භීෂණ', සෝමලතා සුබසිංහගේ 'ඇන්ටිගනී', සුනිල් චන්ද්‍රසිරිගේ 'භීමභූමි' ප්‍රමුඛව ඔහු රංගන දායකත්වය ලබාදුන් වේදිකා නාට්‍ය සංඛ්‍යාව විස්සකට ආසන්නය. 'සිහින දේශය', 'මන්දාකිණී', 'පුරසක්මන', 'සරෝජා'සහ 'දරුවනේ' ඔහු සිය රංග ප්‍රභාව රිදී තිරය මත ප්‍රදර්ශණය කළ චිත්‍රපට වේ. ප්‍රමාණාත්මකව ජනක සිය රංගන දායකත්වය වැඩි වශයෙන් ලබාදි ඇත්තේ ටෙලි නාට්‍යයන්ටය.

ජනක කුඹුකගේ රංගනයෙන් දායකවන නවතම වේදිකා නාට්‍ය 'ආදරණීය සංවාදයක්' පසුගිය අගෝස්තු මස 29 සහ 30 දෙදින කොළඹ ලුම්බිණී රඟහලේදී වේදිකාගත විය. මෙවර 'සන්නස' සමඟ පිළිසඳර කතා බහකට ජනක කුඹුකගේ ඇරියුම් ලබන්නේ එයද නිමිති කරගනිමිනි.

**ඔබ ප්‍රධාන භූමිකාවක් නිරූපනය කරන නවතම වේදිකා නාට්‍යය සුනිල් චන්ද්‍රසිරිගේ 'ආදරණීය සංවාදයක්' නාට්‍යයේ මංගල දර්ශනය පසුගිය මාසයේ විසිනව වෙනිදා ලුම්බිණි රඟහලේදී වේදිකා ගත වුණා. මම කැමතියි අපේ කතා බහ එතනින් පටන් ගන්න. මේ නාට්‍ය සහ එහිළා ඔබගේ රංගන දායකත්වය කවරාකාරයේ එකක්ද?**

උරුගුවේ ජාතික මාරියෝ බෙනඩික් කියන සාහිත්‍යධරයාගේ රචනයක සිංහල පරිවර්තනය තමයි 'ආදරණීය සංවාදයක්' විදිහට සුනිල් චන්ද්‍රසිරි වේදිකාවට ගෙන එන්නේ. මාරියෝ බෙනඩික් කියන්නෙ-න් නාට්‍යකරුවෙක් නෙවෙයි. සාහිත්‍යකරුවෙක්. ඔහුගේ පෙඩ්රෝ ඇන්ඩ් ද කැප්ටන් කියන රචනය නිර්මාණය වෙලා තියෙන්නේ යම් අවස්ථාවදි ඔහු මිත්‍රයෙකුගෙන් ලැබුව අත්දැකීමක් මුල්කරගෙන. උරුගුවේ එවකට තිබුණ දේශපාලන පසුබිම තමයි මේ නාට්‍යයට පාදක වෙන්නේ. මෙහි අන්තර්ගතය වෙන්නේ විප්ලවවාදී තරුණයෙක් සහ ඔහුගෙන් ප්‍රශ්ණ කරන හමුදා නිලධාරියෙක් අතර ඇතිවන ගැටුම. මාරියෝ බෙනඩික් මේ නාට්‍ය ලියනකොට උරුගුවේ තිබුණේ මිලිටරි පාලනයක්. ඒ පාලනයට එරෙහිව කැරලි ගැහුව, ඒකට එරෙහිව නැගී සිටි, මතවාදී අරගල කළ අයෙක් යම් අවස්ථාවක ආරක්ෂක අංශවල අත්අඩංගුවට පත්වෙනවා. ඉන් පසුව ඔහුගෙන් සිදුකෙරෙන ප්‍රශ්ණ කිරීම ආශ්‍රිතව වෙන සිද්ධි දාමය තමයි මේ නාට්‍ය පුරාම තියෙන්නේ. ඔහු මේ නාට්‍යයේ කොතැනකවත් සඳහන් කරලා නෑ ජාතියක්, දේශයක්, ආගමක් වගේ කිසිම දෙයක්. ලෝකයේ ඕනෑම තැනක මේ මොහොතේ වුවත් මේ සිදුවීම සිදුවෙමින් තියෙන්න පුළුවන්. ඒ නිසා මේ නාට්‍යය ලෝකයේ ඕනෑම තැනකට පොදු නාට්‍යයක්.

මෙහි ඇති අපූර්වත්වය තමයි චරිත දෙකක් වටා පැය දෙකකට ආසන්න කාලයක් මේ නාට්‍ය ගලායාම. මම හිතනවා රංග ශිල්පියෙකුට ලොකු අභියෝගාත්මක අවස්ථාවක් මේ කාලය පුරාවට ප්‍රේක්ෂකාගාරය රඳවාගන්න එක. ඒවගේම මෙහි අන්තර්ගතය ප්‍රේක්ෂකාගාරයට ගෙනියන්න. ඒ ඉතාම ජවසම්පන්න රංග කාර්යයක යෙදෙන්න තියන අවස්ථාව නිසා මම මේක ඉතාම කැමැත්තෙන් බාරගත්තා.

මේක සුනිල් චන්ද්‍රසිරි පරිවර්තනය කරලා ඔහුම අධ්‍යක්ෂණය කළ නාට්‍යයක්. පරිවර්තනයකටත් වඩා අනුවර්තනයක් හැටියට තමයි මේක එන්නේ. මම හිතනවා ලංකික ප්‍රේක්ෂකයන්ට මේක අපූර්ව අත්දැකීමක් වෙයි කියලා.

**ඔබ මෙහි නිරූපනය කරන්නේ කැරලිකරුවාගෙන් ප්‍රශ්ණ කරන හමුදා නිලධාරියාගේ භූමිකාව. ඔබට මේ භූමිකාව දැනෙන්නේ කොයි විදිහටද?**

මෙහි තියෙන්නේ නිකන්ම නිලධාරියෙක් විසින් ප්‍රශ්ණ කිරීමක් විතරක් නෙවෙයි. ප්‍රශ්ණ කරන නිලධාරියාගේ සමස්ථ ජීවන රිද්මයම ගොනුවෙලා තියෙන්නේ ඔහුගේ වෘත්තීය ජීවිතයත් එක්ක. ප්‍රශ්ණ කිරීමට ලක්වෙන කැරලිකාර තරුණයා පන්නරය ලබලා තියෙන්නේ විප්ලවීය පසුබිමක් ඇතුළේ. මේ දෙක අතර වන ඉතාම සංකීර්ණ ගැටුම තමයි මෙතනදී භූමිකා නිරූපනයේදී වේදිකාවේ ප්‍රතිනිර්මාණය වන්නේ. අනෙක් එක ඔවුන් කොයිතරම් තමන්ගේ අරමුණු වෙනුවෙන් ක්‍රියාකළත් ඔවුන්ගේ ඇතුළාන්තයේ තියන මිනිස්කම මේ නාට්‍ය පුරාවටම එළියට එනවා. මේ ගැටුම ඇතුළේ වරින්වර මතුවෙනවා ඔවුන්ගේ මනුෂ්‍යත්වය පිළිබඳ ඉතා සංකීර්ණ කතාබහක්. එයම තමයි මේ නාට්‍යයේ තියන අපූර්වභාවයටත් හේතුවෙන්නේ.

සටහන හා සේයාරූ
**ශ්‍රීලාල් සෙනෙවිරත්න**

**ඔබ දශක දෙකකට වැඩි කාලයක් පුරා විවිධ වේදිකා නාට්‍යවල විවිධ චරිත නිරූපනය කර තිබෙනවා. ඒ අතරින් වඩාත් ඔබගේ සිත්ගත්, එහෙමත් නැත්නම් සදාතනික මතකයක් ඉතිරි කළ චරිතය සහ වේදිකා නාට්‍ය මොකක්ද?**

එහෙම එකක් කියලා කියන්න අමාරුයි. මොකද මම වේදිකාවේ නිරූපනය කරලා තියන හැම භූමිකාවක්ම ඉතා සංකීර්ණ භූමිකාවන්. මම හිතනවා එය මා ලබපු භාග්‍යයක් කියලා. විශේෂයෙන්ම 'ඊඩිපස්' නාට්‍යයේ මා නිරූපනය කළ චරිතය, සුනිල් චන්ද්‍රසිරි මීට පෙර අධ්‍යක්ෂණය කළ, මට හොඳම නළුවාට හිමි